# පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය
# බස්නාහිර පළාත
## மாகாண சுகாதார சேவைகள் பணிப்பாளர் அலுவலகம்
## மேல் மாகாணம்
## OFFICE OF THE PROVINCIAL DIRECTOR OF HEALTH SERVICES
## WESTERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | WP/PD/ES/7/වාර්ෂික ස්ථාන මාරු | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023.09.18 |

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
කොළඹ / ගම්පහ / කළුතර.

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2024</u>**

2024 වර්ෂය සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණීන්ගේ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් මා වෙත ඉදිරිපත් කර ඇති නමුත් තවදුරටත් වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ඔබ කාර්යාලය වෙත ලැබී ඇත් නම් අයදුම්පත් භාර ගන්නා **අවසාන දිනය 2023.09.22 දක්වා කාලය ලබා දී ඇති අතර, එම දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදු වන බව කාරුණිකව දන්වමි.**

02. ඒ අනුව, දැනට ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන්ගේ අයදුම්පත් සමඟ ඔවුන්ගේ **වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය අනුපිළිවෙළින් සකස් කරන ලද උප ලේඛනය සහ අයදුම්පත් ඉදිරිපත් නොකළ නමුත් වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය ද වසර 05 සම්පූර්ණ කර ඇති නිලධාරිණීන්ගේ නම් ඇතුළත් උපලේඛනය සේවා කාලය අනුව අනුපිළිවෙළින් සකස් කර 2023.09.26 වන දිනට පෙර මා වෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දන්වමි.**

03. එසේම, වර්තමාන සේවා ස්ථානයේ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියලුම නිලධාරීන්ගේ තොරතුරු එවා ඇති බවටත්, **එම තොරතුරු නිවැරදි බවටත් අදාළ විෂය භාර නිලධාරීන්, පරිපාලන නිලධාරී සහ ආයතන ප්‍රධානීන් වගකිව යුතු බවත් 2023.09.22 දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදු වන බවත් දන්වමි.**

04. තව ද, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණීන් සඳහා 2024 වර්ෂයේ වාර්ෂික ස්තාන මාරු මණ්ඩලය 2023.10.03 වන දින පෙ.ව. 09.30 ට මෙම කාර්යාලයේ දී පැවැත්වීමට තීරණය කර ඇති බව ද දන්වා සිටින අතර, ඒ සඳහා ඔබ කාර්යාලයේ මාණ්ඩලික නිලධාරියෙකු නම් කර මා වෙත එවන ලෙස ද වැඩි දුරටත් දන්වමි.

වෛද්‍ය ධම්මිකා ජයලත්,
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
බස්නාහිර පළාත.

පිටපත් -

1. සෞඛ්‍ය ලේකම් (බ.ප.) - කා.දැ.ගැ.ස.
2. ලේකම්, රජයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණීන්ගේ සංගමය - කා.දැ.ගැ.ස.
3. තොරතුරු තාක්ෂණ අංශය, ප.සෞ.සේ.අ.කාර්යාලය - කා.දැ.ගැ.ස.



| | කාර්යාලය<br>அலுவலகம்<br>Office | පළාත් අධ්‍යක්ෂ<br>மாகாணபணிப்பாளர்Provincial Director | සැලසුම් අංශය<br>திட்டக்கூறு<br>Planning Unit | නි.අධ්‍යක්ෂ(පාලන)<br>பிரதிபணிப்பாளர் (நிர்வாகம்)<br>Deputy Director(Admin) | ප්‍රධාන ගණකාධිකාරී<br>கணக்காளர்<br>Chief Accountant | පරිපාලන නිලධාරී<br>நிர்வாக அதிகாரி<br>Adm. Officer |
|---|---|---|---|---|---|---|
| T.P | 0112434660 | 0112437154 | 0112478677 | 0112434852 | 0112437155 | 0112478868 |
| Fax | 0112478872 | 0112478872 | 0112478872 | 0112478872 | 0112478872 | 0112478872 |
| e-mail | info@healthdept.wp.gov.lk | pd@healthdept.wp.gov.lk | info@healthdept.wp.gov.lk | | | |

මාලිගාවත්ත මහ ලේකම් කාර්යාලය,තැ.පෙ.876,කොළඹ10. மாளிகாவத்தை செயலகம்,த.பெ.இல.876,கொழும்பு 10.Maligawatta Secretariat Building, P.O. Box 876, Colombo 10.
www.healthdept.wp.gov.lk